
# 17. මච්ඡරී බ්‍රාහ්මණො

## සත්තදසමො පාඨො



සාවත්ථියං අදින්නපුබ්බකො නාම බ්‍රාහ්මණො අහොසි. තෙන කස්සචි කිඤ්චි න දින්නපුබ්බං. තස්ස එකො'ව පුත්තො අහොසි පියො මනාපො. බ්‍රාහ්මණො පුත්තස්ස පිලන්ධං දතුකාමො ''සචෙ සුවණ්ණකාරස්ස ආචික්ඛිස්සාමි, වෙතනං දතබ්බං භවිස්සතී''ති සය'මෙව සුවණ්ණං කොට්ටෙත්වා මට්ටානි කුණ්ඩලානි කත්වා අදසි; තෙන'ස්ස පුත්තො 'මට්ටකුණ්ඩලී'ති පඤ්ඤායි.

**තස්ස සොළසවස්සකාලෙ පණ්ඩුරොගො උදපාදි. බ්‍රාහ්මණො වෙජ්ජානං සන්තිකං ගන්ත්වා ''තුම්හෙ අසුකරොගස්ස කිං භෙසජ්ජං කරොථා''ති පුච්ඡි. තෙ අස්ස යං වා තං වා රැක්ඛතචාදිං ආචික්ඛිංසු. සො තං ආහරිත්වා භෙසජ්ජං කරි. තථා කරොන්තස්සෙ'ව තස්ස රොගො බලවා අහොසි. බ්‍රාහ්මණො තස්ස දුබ්බලභාවං ඤත්වා එකං වෙජ්ජං පක්කොසි. සො තං ඔලොකෙත්වා ''අම්හාකං එකං කිච්චං අත්ථි; අඤ්ඤං වෙජ්ජං පක්කොසිත්වා තිකිච්ඡාපෙහී'' ති වත්වා නික්ඛමි.**

**(පාලි පාඨාවලී 2 පොල්වත්තේ බුද්ධදත්ත මහානායක ස්ථවිර)**

## වචන මාලාව

1. කස්සචි - කිසිවකුට
2. කිඤ්චි - කිසිවක්
3. එව - ම
4. අහොසි - වීය
5. කොට්ටෙත්වා - තළා/කොටා
6. මට්ටානි - මට්ටම් වූ
7. කුණ්ඩලානි - කුණ්ඩලාභරණ
8. කත්වා - කොට
9. පිලන්ධනං - පළඳනාව
10. තෙන - එයින්
11. පඤ්ඤායි - ප්‍රසිද්ධ වීය
12. සොළසවස්සකාලෙ - සොළොස් වැනි වියේ දී
13. උදපාදි - හටගත්තේ ය/උපන්නේ ය
14. වෙජ්ජං - වෛද්‍යවරයා
15. ගන්ත්වා - ගොස්
16. අසුකරොගස්ස - අසවල් රෝගයට
17. භෙසජ්ජං - බෙහෙත
18. පුච්ඡි - විමසුවේ ය
19. ආහරිත්වා - ගෙනැවිත්
20. බලවා - බලවත්
21. ඤත්වා - දැන
22. ඔලොකෙත්වා - බලා
23. තිකිච්ඡාපෙහි - ප්‍රතිකාර කරව ව
24. වත්වා - කියා
25. ආනේසි - ගෙනාවේ ය
26. රුක්ඛතචා දිං - ගස් පොතු ආදිය
27. කටච්ඡු - හැන්ද

## පූර්ව ක්‍රියා පද

**පූර්ව ක්‍රියාවක් යනු අවසාන ක්‍රියාවට පෙර කොට නිම වූ ක්‍රියා ය.**

- **බ්‍රාහමණො වෙජ්ජානං සන්තිකං ගන්ත්වා පුච්ඡි.**

  (බමුණා වෛද්‍යවරුන් ළගට ගොස් විමසී ය.)
- වාක්‍ය තැනීමේදී පූර්ව ක්‍රියා පද බොහෝ උපකාර වේ.
- සිංහල භාෂාවේ දී කා, බී, නටා, ගයා, කියා, දුව, පැන ආදිය පූර්ව ක්‍රියා පද ලෙස හඳුන්වනු ලැබේ.
- ඒවා පාලි භාෂාවෙන් සකසා ගන්නා ආකාරය උගනිමු.
- ඉහත වාක්‍යයේ ඉරි ඇඳි පදයේ අග අකුර දෙස බලන්න. ත්වා
- ''ත්වා'' යන ප්‍රත්‍යය පූර්ව ක්‍රියා සාදා ගැනීමේ දී ක්‍රියා මූලය අගට එක් කරනු ලැබේ.
- ''ත්වාන'' යනු ඒ වෙනුවට එක් කළ හැකි තවත් ප්‍රත්‍යයකි.

**මේ පූර්ව ක්‍රියා පද සාදා ඇති ආකාරය බලන්න.**

| ත්වා | | | |
|---|---|---|---|
| ක්‍රියා මූලය | ප්‍රත්‍යය | පූර්ව ක්‍රියාව | අර්ථය |
| පච | ත්වා | පචිත්වා | පිස |
| ධාව | ත්වා | ධාවිත්වා | දුව/දුවලා/දුවගොස් |
| හස | ත්වා | හසිත්වා | සිනාසී |
| දා | ත්වා | දදිත්වා - දත්වා | දී |
| ගච්ඡ | ත්වා | ගච්ඡිත්වා | ගොස් |

| ත්වාන | | | |
|---|---|---|---|
| ක්‍රියා මූලය | ප්‍රත්‍යය | පූර්ව ක්‍රියාව | අර්ථය |
| පච | ත්වාන | පචිත්වාන | පිස |
| ධාව | ත්වාන | ධාවිත්වාන | දුව/දුවලා/දුවගොස් |
| හස | ත්වාන | හසිත්වාන | සිනාසී |
| දා | ත්වාන | ත්වාන - දත්වාන | දී |
| ගච්ඡ | ත්වාන | ගච්ඡිත්වාන | ගොස් |

**පූර්ව ක්‍රියා පද යොදා සකසා ඇති මේ වගන්ති දෙස බලන්න.**

- අහං පාතොව **පබුජ්ඣිත්වා** මුඛං ධොවාමි.

  මම උදේ ම නැගිට මුහුණ සෝදමි.

- සාමණෙරො විහාරං **ගන්ත්වාන** බුද්ධං වන්දති.

  සාමණේරයන් වහන්සේ විහාරයට ගොස් බුදුන් වඳින සේක.

- වෙජ්ජො ගෙහං **පවිසිත්වා** ගිලානං පස්සති.

  වෛද්‍යවරයා ගෙදරට පැමිණ රෝගියා බලයි.

- තාපසො හිමාලයං **වසිත්වාන** චිත්තං වඩ්ඪති.

  තවුසා හිමාලයෙ වාසය කොට භාවනා වඩයි.

- වානරා රුක්ඛං **ආරුහිත්වා** ඵලානි ඛාදිංසු.

  වඳුරෝ ගසට නැග ගෙඩි කෑහ.

## අභ්‍යාසය 17 1

01. සිංහලට නගන්න.

1. කපයො තරුසු නිසීදිත්වා එලෙහි මනුසෙස පහරිංසු.
2. උපාසකො ධම්මං සුත්වා භික්ඛුං වන්දිත්වා ගෙහං ගන්ත්වා භත්තං භුඤ්ජි.
3. ගොපාලො පසවෙහි සද්ධිං සින්ධුං ගන්ත්වා සින්ධුම්හි නහායිත්වා පසවො ගහෙත්වා ගෙහං පවිසිත්වා බන්ධුනො ගෙහං ගච්ඡි.
4. සීහො මිගං මාරෙත්වා ඛාදිත්වා වනං පාවිසි.
5. අහං කටච්ඡුං ගහෙත්වා භික්ඛුනො පත්තෙ දානං පූජෙත්වා වන්දාමි.

02. පාලියට නගන්න.

1. ඇත්ගොව්වා පොරවෙන් ගස් කපා ඇතුන්ට දුන්නේ ය.
2. ගුරුවරු වෙළෙන්දන්ගෙන් කොඩි මිළට ගෙන සිසුන්ට දුන්හ.
3. තාපසයා සිටුමැදුරෙහි දානය වළඳා බණ කියා නික්මුණි.
4. මුවා සිංහයෙකු දැක බිය වී දුව ගොස් කන්දෙන් පැන්නේ ය.
5. අපි මල් කඩා විහාරයට ගොස් බුදුන් වැඳ ඤාතීන්ට පින් දෙමු.

03. ඔබ දන්නා ක්‍රියාපද 5ක් සොයා, ඒවා පූර්ව ක්‍රියා කර වාක්‍යය බැගින් තනන්න.

04. ක්‍රියාපද විස්සක් පූර්ව ක්‍රියා රූපය සාදා පුහුණු වන්න.

05. පාඩමේ ඇති ඡේදය සිංහලට නගන්න.

මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න.

| අකාරාන්ත නපුංසක ලිංග ''ඉම'' ශබ්දය (මෙය) | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | ඉදං, ඉමං | ඉමෙ, ඉමානි |
| ආලපන | --- | --- |
| දුතියා | ඉදං, ඉමං | ඉමෙ, ඉමානි |
| තතියා | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| කරණ | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| චතුත්ථී | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| පඤ්චමී | අම්හා, අස්මා, ඉමම්හා, ඉමස්මා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| ඡට්ඨී | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| සත්තමී | අම්හි, අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

| අකාරාන්ත ඉත්ථි ලිංග ''ඉම'' ශබ්දය (මෑ, මැය) | | |
|---|---|---|
| විභක්තිය | ඒකවචන | බහුවචන |
| පඨමා | අයං | ඉමා, ඉමායො |
| දුතියා | ඉමං | ඉමා, ඉමායො |
| තතියා | ඉමාය | ඉමාහි, ඉමාභි |
| කරණ | ඉමාය | ඉමාහි, ඉමාභි |
| චතුත්ථී | අස්සා, අස්සාය, ඉමාය, ඉමිස්සා, ඉමිස්සාය | ඉමාසං, ඉමාසානං |
| පඤ්චමී | ඉමාය | ඉමාහි, ඉමාභි |
| ඡට්ඨී | අස්සා, අස්සාය, ඉමාය, ඉමිස්සා, ඉමිස්සාය | ඉමාසං, ඉමාසානං |
| සත්තමී | අස්සං, ඉමිස්සං, ඉමායං | ඉමාසු |